**හම්බන්තොට මහා නගර සභාව - 2020**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

හම්බන්තොට මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් වැඩියෙන් ප්‍රතිපූරණය කරගත් රු. 4,771,823 ක වැටුප් හා දීමනා ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත නොකර ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 917,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කසළ ගාස්තු, වාහන කුලී හා ජල ගාස්තු එකතු ආදායම වූ රු. 182,352 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීමෙන් ණයගැති ශේෂය හා ආදායම එම වටිනාකමින්ම අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2** **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 1,494,603 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී විස්තරාත්මක උපලේඛනය සකස් කර ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,081,325 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,017,429 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| i. | ලැබිය යුතු වරිපනම් බදු රු. 2,880,574 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් වසම් 02 කට අදාළව 2013 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් ගාස්තු අයකර තිබීමෙන් තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය වර්ෂ 02 ක් විය. | ඉතිරි හිඟය ඉදිරියේදී අය කිරීමට සහ තක්සේරු වාර්තාව 2021 අප්‍රේල් මස 28 දින ලද නිසා එම දත්ත මුද්‍රණය කිරීමේ කටයුතු අවසන් වූ පසු බදු අයකරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීම සහ තක්සේරුව කාලීනව ක්‍රියාත්මක කළ යුතුය. |
| ii. | ව්‍යාපාර ඒකක 89 කින් ලැබිය යුතු ව්‍යාපාර හා කර්මාන්ත බදු රු. 181,000 ක් හා කසළ ගාස්තු රු.113,545 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ව්‍යාපාර වසා තිබීමෙන් ගාස්තු අයකර ගැනීමට නොහැකි විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| iii. | වරිපනම් දේපල 160 ක් හම්බන්තොට වරාය කටයුතු සඳහා වන්දි ගෙවා ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ගෙන තිබුණු අතර එම දේපල වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් බදු රු. 205,143 ක් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් නොගෙන අයකරගත නොහැකි ශේෂයක් ලෙස සලකා සභාවේ අනුමැතිය මත 2019 පෙබරවාරි 07 දිනැති අංක 8.5 දරණ තීරණය මඟින් කපා හැරීමට කටයුතු කර තිබීමෙන් සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | 2017 වර්ෂයේදී වන්දි ගෙවීමේදී දේපල හිමියන් විසින් වරිපනම් ගෙවීම පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා සභාව වෙත යොමු කරන ලෙස ලිපි මඟින් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කළ අතර 2018 ඔක්තෝබර් 02 දිනැති ලිපිය මඟින් වන්දි ගෙවා අවසන් කර ඇති බව. | දේපල සඳහා වන්දි ගෙවා අවසන් කිරීමට පෙර ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| i. | සභාව සතු කඩ කාමර හා ගොඩනැගිලි බදු දීම වෙනුවෙන් ලැබිය යුතු කඩ කුලී රු. 624,054 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | වෙළඳ අයිතිය බදු දීම සහ සභාව සතු වාහන කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු පිළිවෙලින් රු. 640,965 ක් හා රු. 198,500 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| iii. | සභාව සතු නව පුස්තකාල ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 301 කින් සමන්විත කොටසක් 2017 ජූනි මස සිට 2024 මැයි මස දක්වා ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයට බදුදී තිබුණු අතර බදු දුන් දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස දක්වා වර්ග අඩි 286 ක් සඳහා පමණක් වර්ග අඩියකට රු. 85 බැගින් බදු කුලී අයකර තිබීමෙන් සභාවට රු. 54,825 ක අදායමක් අහිමි වී තිබුණි. තවද වර්ග අඩියකට අය කළයුතු කුලිය විධිමත් පරිදි තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ ජනවාරි මස සිට නව තක්සේරුවකින් ලද බදු කුලිය අය කරන අතර අහිමි වූ රු. 54,825 ක ආදායම අය කර ගැනීම සඳහා ලිඛිතව දැනුම් දුන්නෙමි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමටත් තක්සේරු කුලියක් අය කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු හා දැන්වීම් පුවරු ගාස්තු පිළිවෙළින් රු. 259,120 ක් හා රු.1,400,400 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු හා දැන්වීම් පුවරු ගාස්තු පිළිවෙළින් රු. 10,000 ක් හා රු. 120,000 ක් සඳහා නඩු පවරා ඇති අතර ඉතිරි දැන්වීම් පුවරු සඳහා නඩු පැවරීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 1,000,000 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශව 13 කට එරෙහිව 2018 ජනවාරි 23 දින පනවන ලද රු.218,400 ක් වූ අධිභාරය සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අයකර ගැනීමට සභාවේ නාගරික කොමසාරිස් විසින් කටයුතු කර නොතිබුණි. | අධිභාරය පිළිබඳව නගරාධිපතිතුමා විසින් විෂයභාර අමාත්‍යතුමා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ අතර ඒ සඳහා පිළිතුරුක් ලැබෙන තෙක් අය නොකළෙමි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02 හා 03 ඡේදය ප්‍රකාරව කඩ කාමර කුලිය තක්සේරු කර සභා සම්මත කරගෙන තිබුණද, සභාව සතු කඩ කාමර 50 කට හා ඉඩම් 10 කට අදාලව පැරණි කුළිය අයකිරීම නිසා 2016 වර්ෂයේ ජනවාරි මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සභා අරමුදලට සිදු වූ පාඩුව රු.11,268,359 ක් විය. | සියළුම බදුකරුවන් ලිපි මඟින් දැනුවත් කර ඇති අතර බදුකරුවන් ගිවිසුම්ගත වීමට එකඟ නොවූ බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ රු.මි. 300 ක වියදමින් 2020 ජුනි 25 දින ක්‍රියාත්මක කළ කවෂිමා ව්‍යාපෘතිය මඟින් කාබනික පොහොර නිපදවීමට දිනකට කසළ ටොන් 30 ත් 50 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වුවත් සභා බල ප්‍රදේශයෙන් දෛනිකව රැස්වන දිරන කසළ ප්‍රමාණය ටොන් 01 ත් 1.5 ත් අතර වූයෙන් දෛනික කසළ අවශ්‍යතාවය රැස්කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණු අතර එය රැස්කර ගැනීම සඳහා ක්‍රමවේදයන්ද සකස් කර නොතිබුණි. | හම්බන්තොට නගරය කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සංවර්ධන ව්‍යාපෘති වලට සමගාමීව මෙම ව්‍යාපෘතිය යෝජනා කර තිබූ අතර එම සංවර්ධන ව්‍යාපෘති අතරමග නවතා දැමීම නිසා අපේක්ෂිත කසළ ප්‍රමාණය රැස් කිරීමට අපහසු වූ බවත්, සභාවට ආසන්නව පිහිටි ප්‍රාදේශීය සභා 04 ක් මෙම ව්‍යාපෘතිය සඳහා කසළ ලබා දීමට නොහැකි බවට ලිඛිතව දන්වූ බව. | ශක්‍යතා අධ්‍යනයකින් පසුව ව්‍යාපෘති ආරම්භ කිරීමත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක්ද සකස් කළ යුතුය. |